# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2372/04 - 2024 පෙබරවාරි මස 19 වැනි සඳුදා - 2024.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ
සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2024 පෙබරවාරි මස 19 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **“2024 අංක 03 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි”** ලෙස හඳුන්වනු ලැබේ.

2. පසුව සංශෝධනය කරන ලද, 2023 ජනවාරි මස 01 දිනැති අංක 2312/77 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි මෙයින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද, 2023 දෙසැම්බර් මස 06 දිනැති අංක 23/2380/631/032 දරන සංදේශය සඳහා 2023 දෙසැම්බර් මස 18 දිනැතිව ලබාදුන් අමාත්‍ය මණ්ඩලයේ තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.


1A - PG 6654 — 404 (2024/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. ඉහත සඳහන් කර ඇති 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල අංක 9 දරන රෙගුලාසියේ කෙසේ සඳහන් වුවද, අනුමත ව්‍යවසායයක් විසින් වෙනත් කිසිදු ආකාරයක සෘජු හෝ වක්‍ර විකුණුම් අරමුණු සඳහා නොවන, දේශීයව එකතු කළ අගය අවම වශයෙන් 35% ක් සහිතව සැකසුම් සහ ප්‍රති-අපනයනය කිරීම සඳහා, එම රෙගුලාසි වල V වන උපලේඛනයේ ලැයිස්තුගත කරන ලද පහත උපලේඛනයේ විස්තර කර ඇති භාණ්ඩ ආනයනය සඳහා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ආනයන පාලන බලපත්‍ර නිකුත් කළ යුතුය.

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන පාලන බලපත්‍රය (L)* |
|---|---|---|---|---|---|
| **4** | **09.04** | | | **"පයිපර්" ගණයේ ගම්මිරිස්, කැප්සිකම් ගණයේ හෝ පිමෙන්ටා ගණයේ වියලු හෝ කුඩු කළ හෝ ඇඹරු ගෙඩි.** | |
| | | | - | ගම්මිරිස් : | |
| | | 0904.11 | -- | කුඩු නොකළ හෝ නොඇඹරු : | |
| | | | --- | ඝනත්වය ලීටරයට ග්‍රෑම් 450 නොඉක්මවන සැහැල්ලු ඇට සහිත ගම්මිරිස් : | |
| | | 0904.11.11 | ---- | ඓන්ද්‍රිය | L |
| | | 0904.11.19 | ---- | අනෙකුත් | L |
| | | | | | |
| **7** | **09.08** | | | **සාදික්කා වසාවාසි සහ කරදමුංගු.** | |
| | | | - | සාදික්කා: | |
| | | 0908.11 | -- | කුඩු නොකළ හෝ නොඇඹරු: | |
| | | | --- | ඓන්ද්‍රීය : | |
| | | 0908.11.11 | ---- | පණුවන් ගැසූ හා තත්වයෙන් බාල | L |
| | | 0908.11.19 | ---- | අනෙකුත් | L |
| | | | - | කරදමුංගු: | |
| | | 0908.31 | -- | කුඩුනොකළ හා නොඇඹරු | L |
| | | 0908.32 | -- | කුඩු කළ හෝ ඇඹරු | L |
| | | | | | |
| **8** | **09.10** | | | **ඉඟුරු, කුංකුම (සැප්රන්) , කහ(කුර්කුමා), තයිම්, බේ කොළ, කරපිංචා සහ අනෙකුත් කුළුබඩු වර්ග** | |
| | | | - | ඉඟුරු : | |
| | | 0910.11 | -- | කුඩු නොකළ හෝ නොඇඹරු: | |
| | | 0910.11.10 | --- | වියළි | L |

| | *I තීරුව සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | *II තීරුව සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | *III තීරුව විස්තරය* | *IV තීරුව ආනයන පාලන බලපත්‍රය (L)* |
|---|---|---|---|---|---|
| | | 0910.11.90 | --- | අනෙකුත් | L |
| | | 0910.30 | - | කහ (කුර්කුමා) ඃ | |
| | | 0910.30.10 | --- | කුඩු නොකළ හෝ නොඇඹරූ | L |
| | | 0910.30.90 | --- | අනෙකුත් | L |

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත සහ වෙනත් අදාළ ආයතන වෙත “මෙහෙයුම් උපදෙස්” නිකුත් කරනු ලැබිය යුතුය.

6. ඉහත රෙගුලාසිවලට අදාළව පැන නගින ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසාන තීරණය, ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ලබාදෙනු ලැබේ.

7. *අර්ථ නිරූපණය –*

7.1 මෙම රෙගුලාසියේ අරමුණ සඳහා අනුමත ව්‍යවසායන් ලෙස අදහස් කරනු ලබන්නේඃ
“ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද, 2023 දෙසැම්බර් 06 දිනැති අංක 23/2380/631/032 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023 දෙසැම්බර් 18 දිනැතිව ලබාදුන් අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව අනුමත කරන ලද 'තෝරාගත් කුළුබඩු ආනයනය හා සැකසුම සහ තෙල් නිස්සාරණ, ඔලියොරෙසින් හා අවශේෂ ස්වරූපයෙන් ප්‍රතිඅපනයනය කිරීමේ ක්‍රියා පටිපාටිය' යටතේ, දේශීයව එකතුකළ අගය අවම වශයෙන් 35% ක් සහිතව සැකසුම් සහ ප්‍රතිඅපනයනය කිරීමට, ඉහත රෙගුලාසි අංක 4 හි නිශ්චිතව දක්වා ඇති කුළුබඩු ආනයනය කිරීම සඳහා, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යාංශය හරහා ආයෝජන මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඕනෑම ව්‍යවසායක්”

EOG 02 - 0177

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.